5069



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2017**

| | | |
|---|---|---|
| **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය** | **I, II** | **පැය තුනයි** |
| வணிகக் கல்வியும் கணக்கீடும் | **I, II** | மூன்று மணித்தியாலம் |
| Business and Accounting Studies | **I, II** | *Three hours* |

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

- පහත සඳහන් සිද්ධිය කෙරෙහි අවධානය යොමු කරමින් අංක **1** සිට **4** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

'ශක්ති කන්ස්ට්‍රක්ෂන්ස්' නමින්, පදිංචිය සඳහා ගෙවල් ඉදිකර දීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන ශක්තිට 2016 වර්ෂයේ දී හොඳ ම ඉදිකිරීමේ සම්මානය හිමි විය. ශක්ති තමා විසින් ම පුළුස්සා සකස් කර ගන්නා ගඩොල් පමණක් සිය ඉදිකිරීම් කටයුතු සඳහා භාවිත කරයි.

**1.** මෙම සිද්ධියේ සඳහන් 'ශක්ති කන්ස්ට්‍රක්ෂන්ස්' ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක් ද?
(1) ආහාර (2) ඇඳුම් (3) නිවාස (4) අධ්‍යාපනය

**2.** මෙම සිද්ධියේ සඳහන් 'ශක්ති කන්ස්ට්‍රක්ෂන්ස්' ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?
(1) ඒක පුද්ගල ව්‍යාපාර (2) හවුල් ව්‍යාපාර (3) සංස්ථාපිත සමාගම් (4) සමිති සමාගම්

**3.** ශක්තිගේ ගඩොල් නිෂ්පාදන ව්‍යාපාරය,
(1) ප්‍රාථමික නිෂ්පාදන ව්‍යාපාරයකි. (2) ද්විතීයික නිෂ්පාදන ව්‍යාපාරයකි.
(3) තෘතීයික නිෂ්පාදන ව්‍යාපාරයකි. (4) සේවා නිෂ්පාදන ව්‍යාපාරයකි.

**4.** ඉහත සිද්ධියේ සඳහන් 'ශක්ති කන්ස්ට්‍රක්ෂන්ස්' ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ.
(2) මෙම ව්‍යාපාරයේ ගඩොල් සඳහා වන පිරිවැය සෘජු නිෂ්පාදන පිරිවැයකි.
(3) මෙම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත.
(4) මෙම ව්‍යාපාරය සම්බන්ධව ශක්තිගේ වගකීම සීමිත ය.

**5.** ආර්ථික පරිසර සාධකයක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) බැංකු පොලී අනුපාතිකය (2) ලෝක ළමා දිනය සැමරීම
(3) සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවය සැමරීම (4) සමාගම් පනත

**6.** ව්‍යාපාරයක අයිතිකරු ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය නිම කිරීම ඔහුගේ ව්‍යාපාරයට
(1) ශක්තියකි. (2) දුර්වලතාවකි. (3) අවස්ථාවකි. (4) තර්ජනයකි.

**7.** පහත සඳහන් ලක්ෂණ අතුරෙන් සී/ස සමාගමක ලක්ෂණයක් **නොවන්නේ,**
(1) වගකීම සීමිත වීම ය. (2) නීතිමය පුද්ගලභාවයක් තිබීම ය.
(3) අඛණ්ඩ පැවැත්මක් නොතිබීම ය. (4) අයිතිය පාලනයෙන් වෙන් වීම ය.

**8.** පහත දැක්වෙන්නේ චෙක්පතක චුම්භක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවකි.

| |
|---|
| ⑈015129⑈ 7010⑉055⑆ 0002323980⑈ |
| **A** **B** **C** **D** |

ඉහත **A** හා **C** අක්ෂරවලින් දැක්වෙන අංක පිළිවෙළින් නිරූපණය කරනුයේ,
(1) ගිණුම් අංකය හා බැංකු ශාඛා අංකය ය. (2) බැංකුවේ අංකය හා ගිණුම් අංකය ය.
(3) චෙක්පත් අංකය හා බැංකු ශාඛා අංකය ය. (4) චෙක්පත් අංකය හා බැංකුවේ අංකය ය.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක **9** සිට **11** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එක ම වර්ගයේ පාසැල් බෑග් නිෂ්පාදනය කර අලෙවි කිරීමට අපේක්ෂිත ව්‍යාපාරයක 2018 ජනවාරි මාසය සඳහා ඇස්තමේන්තුගත වියදම් පහත දැක්වේ.

- ❋ වක්‍ර ද්‍රව්‍ය පිරිවැය රු. 5 000
- ❋ වක්‍ර ශ්‍රම පිරිවැය රු. 8 000
- ❋ වක්‍ර වෙනත් වියදම් රු. 7 000
- ❋ මුළු නිෂ්පාදන පිරිවැය රු. 48 000

ජනවාරි මාසය තුළ නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත පාසල් බෑග් ගණන 80 කි. පාසල් බෑගයක් විකිණීමට අපේක්ෂිත මිල රු. 800 කි.

**9.** ජනවාරි මාසය සඳහා ඇස්තමේන්තුගත ප්‍රාථමික පිරිවැය කොපමණ ද?
(1) රු. 20 000 (2) රු. 28 000 (3) රු. 48 000 (4) රු. 68 000

**10.** පාසල් බෑගයක ඇස්තමේන්තුගත පිරිවැය කොපමණ ද?
(1) රු. 250 (2) රු. 350 (3) රු. 600 (4) රු. 850

**11.** පාසල් බෑගයකින් අපේක්ෂිත ලාභය කොපමණ ද?
(1) රු. 50 (2) රු. 200 (3) රු. 350 (4) රු. 450

**12.** සේපාලගේ නමට ලැබුණු රේඛිත චෙක්පත, ඔහු ගාල්ල මහජන බැංකුවේ ඇති තම ජංගම ගිණුමේ තැන්පත් කිරීමට ඉදිරිපත් කළ විට, බැංකු නිලධාරියා විසින් එය තැන්පත් කළ **නොහැකි** බව දැනුම් දෙන ලදී.
එම චෙක්පතෙහි සඳහන් වූ රේඛනය කුමක් ද?

(1) ගනුදෙනු කළ නොහැක (2) ආදායකයාගේ ගිණුමට පමණයි (3) මහජන බැංකුව-ගාල්ල (4) ලංකා බැංකුව-ගාල්ල

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක **13** සහ **14** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සඳුන්ට හිමි රු. 1 000 000 ක් වටිනා මෝටර් රථය ඔහු එම වටිනාකමට ම රක්ෂණය කර තිබුණි. හදිසි අනතුරකින් එම මෝටර් රථයට රු. 400 000 ක හානියක් සිදු විය. සඳුන් ඒ වෙනුවෙන් රු. 1 000 000 ක වන්දියක් රක්ෂණ සමාගමෙන් ඉල්ලා සිටියි.

**13.** සඳුන්ට රක්ෂණ සමාගමෙන් ලැබෙන වන්දි මුදල කොපමණ ද?
(1) රු. 400 000 (2) රු. 600 000 (3) රු. 1 000 000 (4) රු. 1 400 000

**14.** රක්ෂණයේ දී ඉහත සිද්ධියේ සඳහන් සඳුන් හැඳින්වීම සඳහා යොදන යෙදුම කුමක් ද?
(1) රක්ෂකයා (2) රක්ෂිතයා (3) පළමු පාර්ශ්වය (4) තෙවන පාර්ශ්වය

**15.** විද්‍යුත් තැපැල් පණිවුඩය
(1) අභ්‍යන්තර, විද්‍යුත්, වාචික සන්නිවේදන ක්‍රමයකි. (2) බාහිර, විද්‍යුත්, වාචික සන්නිවේදන ක්‍රමයකි.
(3) බාහිර, විද්‍යුත්, සංඥා සන්නිවේදන ක්‍රමයකි. (4) බාහිර, විද්‍යුත්, ලිඛිත සන්නිවේදන ක්‍රමයකි.

**16.** පාසලක විදුහල්පති විසින් විශේෂ රැස්වීමක් දැනුම් දීම සඳහා දෙමාපියන් වෙත ලිපියක් යවයි.
ඉහත සන්නිවේදන ක්‍රියාවලියට අදාළ යවන්නා, මාධ්‍යය හා ලබන්නා පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) විදුහල්පති, ලිඛිත, දෙමාපියන් (2) විදුහල්පති, ලිපිය, දෙමාපියන්
(3) දෙමාපියන්, ලිඛිත, විදුහල්පති (4) දෙමාපියන්, ලිපිය, විදුහල්පති

**17.** කොළඹ වරාය ප්‍රවාහන මූලිකාංගයක් වන .........①......... වන අතර, කොළඹ වරායට පැමිණි නෙවෙස්කා ලේඩි (Neveska Lady) නෞකාව ප්‍රවාහන මූලිකාංගයක් වන .........②......... වේ.
ඉහත ප්‍රකාශයේ ① සහ ② යන ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) මාධ්‍යය, පර්යන්තය (2) පර්යන්තය, මාධ්‍යය
(3) පර්යන්තය, බලය (4) මාර්ගය, මාධ්‍යය

Department of Examinations Sri Lanka

**18.** සාමාන්‍ය කොටස්හි ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභයක් **නොවන්නේ**
(1) ලාභාංශ ආදායම් ය. (2) පොලී ආදායම් ය.
(3) ඡන්ද බලය ය. (4) ප්‍රාග්ධන ලාභ ය.

**19.** පහත ආයෝජන මාර්ග අතුරෙන් අවදානම අඩු ම ආයෝජන මාර්ගය තෝරන්න.
(1) භාණ්ඩාගාර බිල්පත් (2) ඉතිරි කිරීමේ තැන්පතු
(3) ස්ථාවර තැන්පතු (4) සාමාන්‍ය කොටස්

**20.** පොලී ආදායමක් **නොලැබෙන** තැන්පතුව වන්නේ
(1) ස්ථාවර තැන්පතු ය. (2) ඉතිරි කිරීමේ තැන්පතු ය.
(3) ඉල්ලුම් තැන්පතු ය. (4) තැන්පතු සහතික ය.

**21.** පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවකි.
* රු. 50 000 ක් වූ බඩු තොගයක් අත්පිට මුදලට ගැනීම
මෙම ගනුදෙනුව නිසා ව්‍යාපාරයේ,
(1) වත්කම් පමණක් වෙනස් වේ.
(2) වගකීම් පමණක් වෙනස් වේ.
(3) වත්කම් හා වගකීම් පමණක් වෙනස් වේ.
(4) වත්කම්, වගකීම් හා හිමිකම් යන සියල්ල ම වෙනස් වේ.

**22.** පහත ගනුදෙනු අතුරෙන් හිමිකමට බලපෑමක් ඇති **නොකරන** ගනුදෙනුව කුමක් ද?
(1) වරිපනම් ගාස්තු රු. 400 ක් මුදලින් ගෙවීම
(2) අමතර ආදායම් රු. 500 ක් මුදලින් ලැබීම
(3) අයිතිකරු තම පෞද්ගලික මුදලින් ණයහිමියන්ට රු. 5 000 ක් ගෙවීම
(4) රු. 2 000 ක උපචිත විදුලි ගාස්තු මුදලින් ගෙවීම

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක **23** සහ **24** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

* තිසර ව්‍යාපාරය රු. 20 000 ක් පිරිවැය වූ බඩු තොගයක් ණයට ගන්නා ලදී. එහි දී අඩු කළ වෙළෙඳ වට්ටම 10% කි. මුදල් ගෙවීමේ දී 10% ක මුදල් වට්ටමක් ද හිමි විය.

**23.** ඉහත සිද්ධියේ සඳහන් ගනුදෙනු තිසර ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය යටතේ දැක්වූ විට, වත්කම්වලට වන ශුද්ධ බලපෑම වනුයේ
(1) රු. 1 800 කින් අඩු වීම ය. (2) රු. 1 800 කින් වැඩි වීම ය.
(3) රු. 18 000 කින් අඩු වීම ය. (4) රු. 20 000 කින් වැඩි වීම ය.

**24.** තිසර ව්‍යාපාරයේ මුදල් ගෙවීම සම්බන්ධ නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?

(1)

| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු. 18 000 |
| මුදල් ගිණුම | බැර | රු. 18 000 |

(2)

| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු. 20 000 |
| මුදල් ගිණුම | බැර | රු. 20 000 |

(3)

| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු. 18 000 |
| මුදල් ගිණුම | බැර | රු. 16 200 |
| ලද වට්ටම් ගිණුම | බැර | රු. 1 800 |

(4)

| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු. 20 000 |
| මුදල් ගිණුම | බැර | රු. 18 000 |
| ලද වට්ටම් ගිණුම | බැර | රු. 2 000 |

**25.** ව්‍යාපාරයක ලෙජරයේ දැක්වෙන විකුණුම් ගිණුම .........①......... ගිණුමක් වන අතර, ගැනිලි ගිණුම .........②......... ගිණුමක් වේ.
ඉහත ප්‍රකාශනයේ ① සහ ② යන ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ආදායම්, හිමිකම් (2) ආදායම්, වියදම්
(3) වගකීම්, හිමිකම් (4) හිමිකම්, වියදම්

**26.** පහත සඳහන් ගනුදෙනු අතුරෙන් පොදු ජර්නලයේ සටහන් කළ යුතු ගනුදෙනුව තෝරන්න.
(1) අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා මුදලින් රු. 2 000 ක් ගැනීම
(2) ණයගැතියන්ගෙන් රු. 2 000 ක් බොල් ණය ලෙස කපා හැරීම
(3) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 100 000 ක් වටිනා යන්ත්‍රයක් අත්පිට මුදලට ගැනීම
(4) ව්‍යාපාරයට රු. 10 000 ක් වටිනා බඩු තොගයක් ණයට ගැනීම

[හතරවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

5069

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක **27** සහ **28** ට පිළිතුරු සපයන්න.

※ 2017 සැප්තැම්බර් 30 දිනට මුදල් පොතේ බැංකු තීරුවේ ශේෂය රු. 14 100 ක් විය. පහත හේතු නිසා එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනස් විය.

A - තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් රු. 8 000 කි.
B - බැංකුවට සෘජුව ම ලැබී ඇති ණයගැති ප්‍රේෂණ රු. 2 500 කි.
C - ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති රක්ෂණ ගාස්තු රු. 3 500 කි.

**27.** ඉහත හේතු අතුරෙන් මුදල් පොතේ බැංකු තීරුවේ ශේෂය බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා වැඩි වීමට බලපාන හේතුව/හේතු වන්නේ
(1) A පමණි. (2) B පමණි. (3) A හා C පමණි. (4) B හා C පමණි.

**28.** 2017 සැප්තැම්බර් 30 දිනට මුදල් පොතේ සංශෝධිත බැංකු ශේෂය වන්නේ
(1) රු. 5 100 කි. (2) රු. 10 600 කි. (3) රු. 13 100 කි. (4) රු. 16 600 කි.

**29.** සරණගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 3 000 ක් විය. 2017 සැප්තැම්බර් මාසයේ සුළු මුදල් වියදම රු. 2 800 ක් විය. ඔක්තෝබර් 01 දින රු. 3 300 ක් අග්‍රිමය ප්‍රතිපූරණය කරන ලදී. සරණගේ ව්‍යාපාරයේ සුළු මුදල් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඔක්තෝබර් මාසය සඳහා සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 3 500 කි.
(2) සැප්තැම්බර් 30 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල රු. 500 කි.
(3) සැප්තැම්බර් මාසයේ සුළු මුදල් වියදම රු. 3 300 කි.
(4) ඔක්තෝබර් මාසයේ සිට සුළු මුදල් අග්‍රිමය වැඩිවීම රු. 300 කි.

**30.** 2015.01.01 දින රු. 600 000 ක් වටිනා යන්ත්‍රයක් මිල දී ගත් අතර එහි ඵලදායී ජීවිත කාලය වර්ෂ 5කි. එම කාලය අවසානයේ යන්ත්‍රයේ සුන්බුන් අගය රු. 100 000 කි. 2016.12.31 දිනට ශේෂ පත්‍රයේ දැක්විය යුතු සමුච්චිත ක්ෂය ප්‍රමාණය කොපමණ ද?
(1) රු. 100 000 (2) රු. 120 000 (3) රු. 200 000 (4) රු. 240 000

**31.** 2016.07.01 දින ව්‍යාපාරයේ ගොඩනැගිල්ල රක්ෂණය කර වර්ෂයක රක්ෂණ ගාස්තු ලෙස රු. 18 000 ක් එදිනම ගෙවන ලදී.
ඉහත ගනුදෙනුව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) 2016.12.31 දිනෙන් අවසන් වර්ෂයේ, ලාභාලාභ ගිණුමේ දැක්වෙන රක්ෂණ ගාස්තුව රු. 18 000 කි.
(2) 2016.12.31 දිනට උපචිත රක්ෂණ ගාස්තු රු. 9 000 කි.
(3) 2016.12.31 දිනට ජංගම වගකීම් රු. 9 000 කි.
(4) 2016.12.31 දිනට ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු රු. 9 000 කි.

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක **32** සහ **33** ට පිළිතුරු සපයන්න.

※ ණයගැතියකුට දුන් වට්ටම් රු. 1 200 ව්‍යාපාරය විසින් සටහන් කර තිබූ ආකාරය දැක්වෙන ද්විත්ව සටහන පහත දැක්වේ.

දුන් වට්ටම් ගිණුම හර රු. 2 100
ණයගැති ගිණුම බැර රු. 2 100

**32.** ඉහත සටහන නිසා,
(1) ශේෂ පිරික්සුමේ හර හා බැර තීරුවල එකතුව අසමාන වේ.
(2) අවිනිශ්චිත ගිණුමේ රු. 900 ක හර ශේෂයක් ඇති වේ.
(3) දුන් වට්ටම් රු. 900 ක් වැඩියෙන් නියමිත ගිණුම්වල සටහන් කර ඇත.
(4) දුන් වට්ටම් රු. 900 ක් වැඩියෙන් නියමිත ගිණුම්වල වැරදි පැත්තේ සටහන් කර ඇත.

**33.** ඉහත වරද නිවැරදි කිරීමේ ද්විත්ව සටහන වන්නේ,
(1) ණයගැති ගිණුම හර රු. 900
දුන් වට්ටම් ගිණුම බැර රු. 900
(2) දුන් වට්ටම් ගිණුම හර රු. 900
ණයගැති ගිණුම බැර රු. 900
(3) දුන් වට්ටම් ගිණුම හර රු. 1 200
ණයගැති ගිණුම බැර රු. 1 200
(4) ණයගැති ගිණුම හර රු. 2 100
දුන් වට්ටම් ගිණුම බැර රු. 2 100

**34.** සුපිරි ක්‍රීඩා සමාජයේ 2016.01.01 දිනට සිටි සාමාජික සංඛ්‍යාව 200 කි. එක් අයෙකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 50 කි. 2016 වර්ෂය තුළ දී සාමාජිකයින් 30 දෙනෙකු වර්ෂයට අදාළ සාමාජික මුදල් ගෙවා නැත.
ඉහත ක්‍රීඩා සමාජය සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) 2016 වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමේ දැක්වෙන සාමාජික මුදල් ආදායම රු. 120 000 කි.
(2) 2016 වර්ෂයේ ලැබීම් හා ගෙවීම් ගිණුමේ දැක්වෙන සාමාජික මුදල රු. 102 000 කි.
(3) මාසික සාමාජික මුදල් ආදායම රු. 10 000 කි.
(4) 2016 වර්ෂයේ හිඟ සාමාජික මුදල රු. 1 500 කි.

[පස්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

- පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන ප්‍රශ්න අංක **35** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සුමුදු 2016.01.01 දින රු. 330 000 ක් යොදා ආරම්භ කළ වෙළෙඳ ව්‍යාපාරයේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආධුනික ගිණුම් ලිපිකරු විසින් පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශ පහත දැක්වේ.

**වෙළෙඳ හා ලාභාලාභ ගිණුම**

| | රු. | රු. |
|---|---|---|
| **ආදායම්** | | |
| විකුණුම් | 250 000 | |
| ලද වට්ටම් | 3 000 | |
| | | 253 000 |
| **වියදම්** | | |
| ගැනුම් | 160 000 | |
| ගෙන ඒමේ කුලී | 5 000 | |
| ප්‍රචාරණ ගාස්තු | 10 000 | |
| ගෙවල් කුලී | 12 000 | |
| බැංකු ණය පොලී | 6 000 | |
| විදුලි ගාස්තු | 2 500 | |
| දුන් වට්ටම් | 1 000 | |
| | | (196 500) |
| ශුද්ධ ලාභය | | 56 500 |

**ශේෂ පත්‍රය**

| | රු. |
|---|---|
| **වත්කම්** | |
| මෝටර් රථය | 300 000 |
| ලී බඩු | 100 000 |
| ණයගැතියෝ | 30 000 |
| මුදල් ශේෂය | 45 000 |
| | 475 000 |
| **හිමිකම් හා වගකීම්** | |
| ප්‍රාග්ධනය | 330 000 |
| ශුද්ධ ලාභය | 56 500 |
| බැංකු ණය | 50 000 |
| ණයහිමියෝ | 36 000 |
| උපචිත බැංකු ණය පොලී | 2 500 |
| | 475 000 |

**35.** මෙම ව්‍යාපාරයේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වනුයේ
(1) රු. 160 000 කි. (2) රු. 165 000 කි. (3) රු. 196 500 කි. (4) රු. 253 000 කි.

**36.** මෙම ව්‍යාපාරයේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය වනුයේ
(1) රු. 85 000 කි. (2) රු. 88 000 කි. (3) රු. 90 000 කි. (4) රු. 93 000 කි.

**37.** මෙම ව්‍යාපාරයේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන වෙළෙඳ හා ලාභාලාභ ගිණුමේ දැක්විය යුතු ආයතන හා පරිපාලන වියදම්වල එකතුව වනුයේ
(1) රු. 11 000 කි. (2) රු. 12 000 කි. (3) රු. 14 500 කි. (4) රු. 31 500 කි.

**38.** මෙම ව්‍යාපාරයේ 2016.12.31 දිනට පවතින ජංගම වත්කමක් හා ජංගම වගකීමක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ණයගැතියෝ, උපචිත ණය පොලී (2) මුදල් ශේෂය, බැංකු ණය
(3) ලී බඩු, ණයහිමියෝ (4) ණයහිමියෝ, මුදල් ශේෂය

**39.** මෙම ව්‍යාපාරයේ 2016.01.01 සිට 2016.12.31 දිනට හිමිකමේ වැඩි වීම
(1) රු. 45 000 කි. (2) රු. 56 500 කි. (3) රු. 330 000 කි. (4) රු. 386 500 කි.

**40.** මෙම ව්‍යාපාරයේ 2016.12.31 දිනට මුළු වත්කම් හා මුළු වගකීම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) රු. 475 000 හා රු. 475 000 (2) රු. 386 500 හා රු. 88 500
(3) රු. 88 500 හා රු. 475 000 (4) රු. 475 000 හා රු. 88 500

* *

/හයවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

OLD 60 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**වැදගත්:** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද**, II කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද** බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

**1.** පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කාබනික පොහොර භාවිතයෙන් කෙසෙල් වගාවක් පවත්වාගෙන යන ඉඩම් හිමි වැවිලිකරුවෙකු සහ කෘෂිකර්ම උපාධියක් හිමි කෝලිත සිය නිෂ්පාදන, ප්‍රදේශයේ පලතුරු වෙළෙඳසැල්වලට සැපයීම මෙන් ම සති පොළට ගෙන ගොස් අලෙවි කිරීම ද කරයි.

පරිසරවේදියකු වන භානුක, කෝලිතගේ ව්‍යාපාරයෙන් බැහැර කරන කෙසෙල් කඳන් හා කෙසෙල් කොළ මිල දී ගෙන ඒවා වේලා පදම් කර කෑම ඇසුරුම් සකස් කර ආපනශාලාවලට හා කාර්යාල සේවකයින්ට අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 'බනානා ලීෆ්' නමින් පවත්වාගෙන යයි.

'බනානා ලීෆ්' ව්‍යාපාරයේ 2017 අගෝස්තු 01 දිනට පැවති වත්කම් හා වගකීම් පහත දැක්වේ.

- මුදල් .................................................... රු. 8 000
- ණයගැතියෝ .................................................... රු. 5 000
- ණයහිමියෝ .................................................... රු. 3 000
- නිෂ්පාදන උපකරණ .................................................... රු. 40 000
- බැංකු ණය .................................................... රු. 20 000

2017 අගෝස්තු මාසය තුළ දී 'බනානා ලීෆ්' ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදු විය.

- කෙසෙල් කඳන් හා කොළ ගැනුම් - අත්පිට මුදලට රු. 8 000
  - ණයට රු. 12 000
- කෑම ඇසුරුම් විකුණුම් - අත්පිට මුදලට (ඒකක 1 000) රු. 20 000
  - ණයට (ඒකක 2 000) රු. 40 000
- ණයගැතියන්ගෙන් ලැබීම් රු. 35 000
- ණයහිමියන්ට ගෙවීම් රු. 10 000
- කෑම ඇසුරුම් නිෂ්පාදනය සඳහා අගෝස්තු මාසය තුළ දී පහත වියදම් ගෙවා ඇත.
  - * විදුලි ගාස්තු .................................... රු. 3 000
  - * නිෂ්පාදනාගාරය සඳහා කුලිය .................... රු. 4 000
  - * ප්‍රවාහන වියදම් .................................... රු. 3 600
  - * අත් උදව්කරුගේ වැටුප ........................... රු. 5 000
- නිෂ්පාදන උපකරණ මාසය ආරම්භයේ වටිනාකම මත වාර්ෂිකව 12% බැගින් ක්ෂය කෙරේ.
- 2017 අගෝස්තු 31 දිනට ඉතිරි තොග කිසිවක් නොවී ය.

2017 සැප්තැම්බර් 01 දින සිට රජය විසින් පොලිතින් භාවිතය තහනම් කිරීම නිසා 'බනානා ලීෆ්' ව්‍යාපාරයේ නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් පවතී.

(i) (අ) 'බනානා ලීෆ්' ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත් වේ ද?

(ආ) කෝලිතගේ ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් ලියන්න.

[හත්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(ii) කෝලිත මෙන් ම භානුක ද වක්‍ර නිෂ්පාදනයේ යෙදේ.
(අ) මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද?
(ආ) ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(iii) 'බනානා ලීෆ්' ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
(අ) මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද?
(ආ) ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(iv) (අ) රජය විසින් පොලිතින් භාවිතය තහනම් කිරීමේ නීතියක් පැනවීම කුමන ව්‍යාපාර පරිසරයට අයත් ද?
(ආ) 'බනානා ලීෆ්' ව්‍යාපාරයේ ඍජු වියදමක් සහ වක්‍ර වියදමක් ලියන්න.

(v) මෙම සිද්ධියේ සඳහන් වන ප්‍රාථමික නිෂ්පාදන ව්‍යාපාරයක් සහ ද්විතීයික නිෂ්පාදන ව්‍යාපාරයක් සඳහා නිදසුනක් බැගින් ලියන්න.

(vi) (අ) 2017 අගෝස්තු 01 දිනට 'බනානා ලීෆ්' ව්‍යාපාරයේ හිමිකම කොපමණ ද?
(ආ) 'බනානා ලීෆ්' ව්‍යාපාරය භාවිත කරන මූලික සටහන් පොත් **දෙකක්** නම් කරන්න.

(vii) (අ) 2017 අගෝස්තු මාසයේ නිෂ්පාදන උපකරණ ක්ෂය ගිණුම්ගත කිරීමට අදාළ ජර්නල් සටහන ලියන්න.
(ආ) 2017 අගෝස්තු 31 දිනට නිෂ්පාදන උපකරණවල ධාරණ අගය කොපමණ ද?

(viii) 2017 අගෝස්තු මාසය සඳහා 'බනානා ලීෆ්' ව්‍යාපාරයේ මුදල් ගිණුම පිළියෙල කර, 2017 අගෝස්තු 31 දිනට මුදල් ශේෂය ගණනය කරන්න.

(ix) 2017 අගෝස්තු 31 දිනට 'බනානා ලීෆ්' ව්‍යාපාරයේ
(අ) ජංගම වත්කමක් හා
(ආ) ජංගම වගකීමක් අගයයන් සහිතව ලියන්න.

(x) 2017 අගෝස්තු 31 දිනට 'බනානා ලීෆ්' ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය අගයයන් සහිතව දක්වන්න.

**(ලකුණු 02 × 10 = 20 යි)**

**I කොටස - ව්‍යාපාර අධ්‍යයනය**

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

**2.** (i) මිනිස් වුවමනාවක් යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) (අ) ව්‍යාපාරයක බාහිර පරිසර සාධක **දෙකක්** ලියන්න.
(ආ) "වර්තමානයේ වැඩිහිටි ජනගහනය ඉහළ යාමේ ප්‍රවණතාවක් පවතී." මෙම ප්‍රකාශය තුළින් මතු කර ගත හැකි බාහිර පරිසර සාධකය කුමක් ද? (ලකුණු 02 යි)

(iii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.
(අ) ජීවත්වීම සඳහා මිනිසා විසින් අනිවාර්යයෙන් ම සපුරා ගත යුතු දෑ මිනිස් අවශ්‍යතා වේ.
(ආ) නිෂ්පාදනය මූලික වශයෙන් ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික ලෙස වර්ග කෙරේ.
(ඉ) පුද්ගලයා තමාට අවශ්‍ය දෑ තමා විසින් ම නිෂ්පාදනය කර ගැනීම වක්‍ර නිෂ්පාදනය වේ.
(ඊ) සී/ස සමාගමක කොටස්කරුවන්ගේ වගකීම ඔවුන් සමාගමේ ආයෝජනය කළ ප්‍රාග්ධනයට සීමා වේ. (ලකුණු 02 යි)

(iv) ශ්‍රී ලංකා ටෙලිකොම් (පීඑල්සී) හි සේවකයින් විසින් පවත්වාගෙන යනු ලබන සමගි ආපනශාලාවේ අලෙවි කිරීමට තබා ඇති ජාතික පශු සම්පත් මණ්ඩලය (NLDB) මගින් සපයනු ලබන කිරි හට්ටි සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. පහත A, B, C හා D සඳහා ඉහත සිද්ධියේ සඳහන් වන නිදසුන බැගින් ලියන්න.

A - සේවා සැපයීමේ ව්‍යාපාර
B - රාජ්‍ය අංශයේ ව්‍යාපාර
C - සමිති සංවිධාන
D - ලාභ අරමුණු කර නොගත් සංවිධාන (ලකුණු 02 යි)

(v) සුනිමල් පදම් කළ හම් භාවිතයෙන් සපත්තු නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.
(අ) සුනිමල්ගේ ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක් ද?
(ආ) සුනිමල්ගේ සපත්තු නිෂ්පාදන ව්‍යාපාරය ප්‍රාථමික නිෂ්පාදනයට අයත් වේ. ඔබ මෙම ප්‍රකාශය හා එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 10 යි)**

[අටවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**3.** (i) චෙක්පතක් යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) (අ) රක්ෂණ මූලධර්ම **දෙකක්** ලියන්න.

(ආ) රක්ෂණය හා ආරක්ෂණය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) රන් භාණ්ඩ උකසට ගන්නා බැංකුවකට ඔවුන් උකසට ගන්නා රන් භාණ්ඩ රක්ෂණය කළ හැකි ය.

(ආ) සන්නිවේදන ක්‍රියාවලිය සම්පූර්ණ වීමට ප්‍රතිපෝෂණය අවශ්‍ය නැත.

(ඉ) ඉතිරි කිරීමේ ගිණුමේ පවතින ශේෂය ඉක්මවා මුදල් ලබා ගැනීමට බැංකුව ලබා දෙන අවසරය බැංකු අයිරා පහසුකම වේ.

(ඊ) රක්ෂණයේ දී අවදානම භාර ගන්නා පාර්ශ්වය රක්ෂිතයා වේ. (ලකුණු 02 යි)

(iv) (අ) "කොළඹ වරාය පුළුල් කිරීම මගින් ව්‍යාපාරික කටයුතු කාර්යක්ෂම වේ."


ඉහත ප්‍රකාශයේ සඳහන් ප්‍රවාහනයට සෘජුව ම සම්බන්ධ වන ප්‍රවාහන මූලිකාංගය නම් කරන්න.

(ආ) සුමතිපාල යාපනයේ අර්තාපල් ගොවියකු වන රාමචන්ද්‍රන්ගෙන් අර්තාපල් තොග විශාල වශයෙන් මිල දී ගෙන සති පොළේ වෙළෙඳාම් කරන පියල්ට අලෙවි කරයි.

ඉහත සිද්ධියට අදාළ බෙදාහැරීමේ ක්‍රියාවලිය රූප සටහනකින් දක්වන්න. (ලකුණු 02 යි)

(v) රෙදිපිළි ව්‍යාපාරිකයකු වන තරංග පෙරේරා 2017.10.01 දින රු. 8 500 ක් වටිනා රෙදිපිළි තොගයක් ගාමිණී සිල්වාගෙන් මිල දී ගෙන චෙක්පතක් නිකුත් කරන ලදී.

චෙක්පතක ආකෘතියක් පහත දැක්වේ.




(අ) ඉහත චෙක්පත් ආකෘතියේ Ⓐ, Ⓑ, Ⓒ හා Ⓓ යන ස්ථානවල ලිවිය යුතු තොරතුරු සිද්ධියෙන් තෝරාගෙන ලියන්න.

(ආ) ඉහත චෙක්පතේ අණකරු හා අණලද්දා වෙන වෙන ම දක්වන්න. (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 10 යි)**

**4.** (i) ආයෝජන කළඹක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) (අ) මූල්‍ය සම්පාදන මාර්ග **දෙකක්** ලියන්න.

(ආ) භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) කොටස් වෙළෙඳපොළ කටයුතු විධිමත්ව හා සාධාරණව පවත්වාගෙන යාම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණකි.

(ආ) ආයෝජනයක අවදානම ඉහළ යන විට අපේක්ෂිත ප්‍රතිලාභය ද ඉහළ යයි.

(ඉ) ව්‍යාපාර සංවිධාන ක්‍රමය අනුව මූල්‍ය සම්පාදන මාර්ග ද වෙනස් වේ.

(ඊ) මූල්‍ය සම්පාදන මාර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු ප්‍රධානත ම සාධකය ප්‍රතිලාභයයි. (ලකුණු 02 යි)

(iv) නිසල රු. 100 000 ක් ආයෝජනය කර එකක් රු. 50 ක් වූ සාමාන්‍ය කොටස් මිල දී ගන්නා ලදී. හය මසකට පසුව ඔහු සියලු ම සාමාන්‍ය කොටස් රු. 120 000 කට විකුණන ලදී. ආයෝජන කාලය තුළ ඔහු කොටසකට රු. 3 ක ලාභාංශයක් ලැබී ය.

(අ) රු. 100 000 කට ගත් කොටස් රු. 120 000 කට විකිණීමෙන් ලද ප්‍රතිලාභය හඳුන්වන්නේ කුමන නමකින් ද?

(ආ) නිසල ලැබූ මුළු ලාභාංශ ආදායම කොපමණ ද? (ලකුණු 02 යි)

[නවවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

5072

(v) ඉදිරි මාසය තුළ දී විශ්‍රාම යාමට අපේක්ෂිත ඉහළ අවදානම් දැරීමට අකමැති බණ්ඩාර තම සේවක අර්ථ සාධක අරමුදලෙන් ලැබීමට නියමිත මුදල ආයෝජනය කිරීම සඳහා පහත ආයෝජන මාර්ග දෙක සලකා බලමින් සිටී.

1. 15% ක වාර්ෂික පොලියක් හිමි ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කිරීම
2. කොටස් වෙළෙඳපොළේ 25% ක අපේක්ෂිත වාර්ෂික ප්‍රතිලාභයක් සහිත සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීම

(අ) ඉහත ආයෝජන මාර්ගවලින් ඔබ බණ්ඩාරට යෝජනා කරන ආයෝජන මාර්ගය කුමක් ද?

(ආ) ඔබ එම ආයෝජන මාර්ගය තෝරා ගැනීමට හේතු දක්වන්න. (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 10 යි)**

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

**5.** (i) පහත ගනුදෙනුවලට අදාළ ද්විත්ව සටහන් ලියන්න.

(අ) අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා මුදලින් රු. 2 000 ක් ගැනීම

(ආ) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා ඔටෝ ට්‍රේඩර්ස් වෙතින් රු. 500 000 ක් වටිනා මෝටර් රථයක් ණයට ගැනීම (ලකුණු 02 යි)

(ii) ව්‍යාපාරයක 2017.01.01 දිනට පැවති වත්කම්, වගකීම් හා හිමිකම් ශේෂ සහ ජනවාරි මාසයේ පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණය යටතේ සටහන් කර තිබූ ආකාරය පහත දැක්වේ.

| | | වත්කම් (රු.) | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|---|---|
| 2017.01.01 | ශේෂය | 200 000 | = | 150 000 | | 50 000 |
| | (1) | + 25 000 (මුදල්) | = | – | | + 25 000 (බැංකු ණය) |
| | (2) | – 10 000 (බඩු තොග)<br>+ 15 000 (ණයගැති) | = | + 5 000 (ලාභය) | | – |
| | (3) | – 7 000 (මුදල්) | = | – 7 000 (කඩ කුලී) | | – |
| | (4) | – 6 000 (මුදල්) | = | – | | – 6 000 (ණයහිමි) |

**අවශ්‍ය වන්නේ:**

(අ) ඉහත එක් එක් ගනුදෙනුව අගයයන් සහිතව ලිවීම

(ආ) සතිය තුළ දී මුළු වත්කම්වල සහ මුළු හිමිකම්වල වැඩි වීම හෝ අඩු වීම වෙන වෙන ම දැක්වීම (ලකුණු 04 යි)

(iii) ව්‍යාපාරයක 2017 මැයි මාසය සඳහා පිළියෙල කළ ගැනුම් ජර්නලය හා විකුණුම් ජර්නලය පහත දැක්වේ.

**ගැනුම් ජර්නලය**

| දිනය | ඉන්: අංකය | සැපයුම්කරු | මුළු වටිනාකම (රු.) | ලෙ.පි |
|---|---|---|---|---|
| 5/10 | 005 | නාලක | 4 800 | |
| 5/18 | 1008 | වාසනා | 15 000 | |

**විකුණුම් ජර්නලය**

| දිනය | ඉන්: අංකය | ගැනුම්කරු | මුළු වටිනාකම (රු.) | ලෙ.පි |
|---|---|---|---|---|
| 5/12 | 326 | මදාරා | 6 200 | |
| 5/26 | 327 | විමල් | 3 000 | |

**අවශ්‍ය වන්නේ:**

(අ) ඉහත ගැනුම් ජර්නලය හා විකුණුම් ජර්නලය 2017 මැයි 31 දිනට සම්පූර්ණ කිරීම

(ආ) ගැනුම් ජර්නලයේ හා විකුණුම් ජර්නලයේ ගනුදෙනු ලෙජර් ගිණුම්වලට පිටපත් කිරීම (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 10 යි)**

[දහවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

6. (i) පහත දැක්වෙන්නේ ගිණුම්කරණයේ දී සිදු වූ වැරදි කිහිපයකි.

A - ණයට විකුණුම් රු. 4 500 විකුණුම් ජර්නලයේ සටහන් කර ඇත්තේ රු. 5 400 ක් ලෙස ය.
B - ගෙවූ වරිපනම් ගාස්තු රු. 1 200 සටහන් කර ඇත්තේ මුදල් ගිණුමේ පමණි.
C - රු. 8 000 ක් වූ විදුලි ගාස්තු ගිණුමේ ශේෂය, ශේෂ පිරික්සුමට උපුටාගෙන නැත.
D - රු. 6 000 ක ගැනුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන් ම පොත්වල සටහන් වී නැත.
E - ගෙවූ රක්ෂණ ගාස්තු රු. 2 500 ක් වරිපනම් ගාස්තු ගිණුමට හර කර ඇත.
F - දුන් වට්ටම් රු. 1 300 අදාළ ණයගැති ගිණුමේ රු. 3 100 ක් ලෙස සටහන් කර ඇත.

**අවශ්‍ය වන්නේ:**

ඉහත වැරදි අතුරෙන්

(අ) ශේෂ පිරික්සුමේ සමානත්වයට බලනොපාන වැරදි

(ආ) ශේෂ පිරික්සුමේ සමානත්වයට බලපාන වැරදි

වෙන වෙන ම ලිවීම

(ඉ) A හා B වැරදි, නිවැරදි කිරීමේ ජර්නල් සටහන් ලිවීම (ලකුණු 04 යි)

(ii) පහත දැක්වෙන්නේ 2017 සැප්තැම්බර් මාසය සඳහා ව්‍යාපාරයක් පිළියෙල කළ බැංකු ගිණුම හා බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයයි.

**බැංකු ගිණුම**

| දිනය | ල.අ | විස්තරය | ස/පි | වටිනාකම (රු.) | දිනය | ච/අ | විස්තරය | ස/පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 9/01 | | ශේෂය | | 18 500 | 9/07 | | ණයහිමි 667615 | | 3 000 |
| 9/10 | | චෙක් තැන්පත් 562518 | | 9 000 | 9/10 | | කඩකුලී 667616 | | 4 000 |
| 9/22 | | චෙක් තැන්පත් 336215 | | 16 000 | 9/28 | | ගැනුම් 667617 | | 20 000 |
| | | | | | 9/30 | | ශේෂය ප/ග | | 16 500 |
| | | | | 43 500 | | | | | 43 500 |

**බැංකු ප්‍රකාශනය**

| දිනය | විස්තරය | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 9/01 | ශේෂය | | | 18 500 |
| 9/08 | 667615 | 3 000 | | 15 500 |
| 9/11 | චෙක් තැන්පත් 562518 | | 9 000 | 24 500 |
| 9/12 | 667616 | 4 000 | | 20 500 |
| 9/25 | සෘජු ප්‍රේෂණ | | 8 000 | 28 500 |
| 9/30 | ස්ථාවර නියෝග (රක්ෂණ ගාස්තු) | 5 000 | | 23 500 |

**අවශ්‍ය වන්නේ:**

(අ) 2017.09.30 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

(ආ) 2017.09.30 දිනට බැංකු සැසඳුම් විස්තරය (ලකුණු 06 යි)

(මුළු ලකුණු 10 යි)



Department of Examinations Sri Lanka

7. රංගගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2016.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 200 000 |
| බෙදාහැරීමේ රථ (පිරිවැයට) | 250 000 | |
| බෙදාහැරීමේ රථ ක්ෂය වෙන් කිරීම (2016.01.01 දිනට) | | 30 000 |
| තොගය (2016.01.01 දිනට) | 35 000 | |
| 12% බැංකු ණය | | 50 000 |
| රක්ෂණ ගාස්තු | 12 000 | |
| විකුණුම් | | 220 000 |
| ගැනුම් | 170 000 | |
| ණයගැතියෝ | 30 000 | |
| ණයහිමියෝ | | 40 000 |
| ලද වට්ටම් | | 4 000 |
| දුන් වට්ටම් | 2 500 | |
| බැංකු ණය පොලී | 4 000 | |
| බොල් ණය | 1 000 | |
| විදුලි ගාස්තු | 1 500 | |
| වරිපණම් | 2 000 | |
| පරිපාලන වියදම් | 6 000 | |
| මුදල් ශේෂය | 30 000 | |
| | 544 000 | 544 000 |

අමතර තොරතුරු:

* 2016.12.31 දිනට තොගය රු. 28 000 කි.
* බෙදාහැරීමේ රථ පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය අකෙරේ.
* 2016.12.31 දිනට ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු රු. 2 000 කි.

**අවශ්‍ය වන්නේ:**

(i) 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළෙඳ හා ලාභාලාභ ගිණුම (ලකුණු 05 යි)

(ii) 2016.12.31 දිනට ශේෂ පත්‍රය (ලකුණු 05 යි)

(මුළු ලකුණු 10 යි)

* * *

Department of Examinations Sri Lanka